# ලංසු සඳහා ආරාධනයයි (IFB)

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ යෝජිත ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම

**ලංසු අංක : 2019/WU/TP/NCB/05**

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සෞදි අරාබි රාජධානියෙන්, වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ, මාකඳුර යෝජිත ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් පිරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය මුදලේ ලැබීම් වලින් කොටසක් කොන්ත්‍රාත් අංක 2019/WU/TP/NCB/05 යටතේ වන ගෙවීම් සඳහා යොදා ගැනීමට අදහස් කෙරේ.

2. ශ්‍රී ලංකාව, කුලියාපිටිය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය, නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙනුවෙන්, අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති විසින් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ මාකඳුර පරිශ්‍රයේ යෝජිත ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් දැන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

   **වැඩ පිළිබඳ ලුහුඬු විස්තරය.**

   ව්‍යාපෘතිය පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම්වලින් සමන්විත වේ. විවිධ නිර්දිෂ්ඨ මධ්‍යස්ථානය, නගර පහසුකම් මධ්‍යස්ථානය, විධායක කාර්ය මණ්ඩල නිල නිවාස, අධ්‍යයන කාර්යමණ්ඩල නිල නිවාස, අනධ්‍ය සහ කාර්යමණ්ඩල නිල නිවාස දිවා සුරැකුම් මධ්‍යස්ථානය, RCC සැකිල්ල ඇතුළු ප්‍රවේශ ගේට්ටුව, පියගැටපෙළ, වහල සෙවිළි කිරීම, පෙදරේරු වැඩ, ජල රෝධක, ව්‍යුහමය ලෝහ වැඩ, දොර හා ජනේල, පාටිෂන් වැඩ, බිත්ති, ගෙබිම හා සිවිලිම නිමාකිරීම් සහ පින්තාරු කිරීම් යන සියල්ල ඇතුළුව MEP ස්ථාපනය කිරීම්, සෝපානය ස්ථාපනය, ගෘහභාණ්ඩ සැපයීම හා සවිකිරීම හා චිත්‍ර සටහන් හා පිරිවිතරයන් පරිදි භාහිර වැඩ පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක කිරීම ඇතුළුව.

   **මාකඳුර පරිශ්‍රයේ පිහිටා ඇත.**

   අපේක්ෂිත ඉදිකිරීම් කාලය - දින 548 කි.

   2.1. ලංසුකරණය නිමා කළ / ප්‍රමාණය අනුව ගෙවීමේ ස්ථාවර මිල ගණන් ක්‍රමයට මෙහෙයවනු ලැබේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛන ගත නොවූවකු විය යුතු අතර, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ CS1 ශ්‍රේණිය සඳහා ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර එය ලංසු භාරගැනීමේ අවසාන දිනය දක්වා වලංගු විය යුතුය. ලියාපදිංචිය කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන දිනයේදීද වලංගු විය යුතුය.

   **ලංසු ඉදිරිපත් කිරීමට යෝග්‍යතාව :**

   **ශ්‍රී ලංකා කොන්ත්‍රාත්කරුවන් :**

   ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ CS1 හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

   **සෞදි අරාබි කොන්ත්‍රාත්කරුවන් :**

   ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සෞදි අරාබි රාජධානියේ ව්‍යාපාර ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර, ශ්‍රී ලංකා CIDA ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ CS1 හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචිය සහිත ශ්‍රී ලාංකික කොන්ත්‍රාත් කරුවකු හා සමග හවුල් ව්‍යාපාරයක නිරත වූ අයකු විය යුතුය.

   CIDA ලියාපදිංචිය ලංසු භාරගන්නා අවසාන දිනය දක්වා වලංගු විය යුතු අතර, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන දිනයේදීද වලංගු විය යුතුය.

   **අවශ්‍ය CIDA ලියාපදිංචිය :**

   **ශ්‍රී ලංකා කොන්ත්‍රාත්කරුවන් :**

   ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සමග ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ CS1 හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි වී සිටිය යුතුය.

   **සෞදි අරාබි කොන්ත්‍රාත්කරුවන්**

   ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සෞදි අරාබි රාජධානියේ ව්‍යාපාර ලියාපදිංචිය ලබා තිබිය යුතු අතර, ශ්‍රී ලංකා CIDA ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ CS1 හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචිය සහිත ශ්‍රී ලාංකික කොන්ත්‍රාත්කරුවකු හා සමග හවුල් ව්‍යාපාරයක නියුතු වූවකු විය යුතුය.

4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතාවලට පහත සඳහන් දෑ ද ඇතුළත්ය.

   අ) ලංසුකරු, සමාන ස්වභාවයේ (අවම වශයෙන් මහල් 3 ක RCC ගොඩනැගිලි), සංකීර්ණතාවයේ හා ශ්‍රී ලංකා රුපියල් මිලියන 1200 ක් හෝ ඇමරිකන් ඩොලර් මිලියන 6.5 කට නොඅඩු කොන්ත්‍රාත් අගයක ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති අඩු තරමින් 1 ක් හෝ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් පසුගිය වසර 5 තුළ සම්පූර්ණ කර තිබිය යුතුය. මාස 12 ක කාලසීමාවක් තුළ සම්පූර්ණ කළ වැඩ ප්‍රමාණයේ සාමාන්‍යය අගය ශ්‍රී ලංකා රුපියල් මිලියන 360 කට හෝ ඇමරිකන් ඩොලර් මිලියන 1.9 කට නොඅඩුවිය යුතු අතර, ලංසුකරු ආසන 500 ක ධාරිතාවය සහිත ශ්‍රවණාගාරයක්ද සම්පූර්ණ කර තිබිය යුතුය.

   ආ) පසුගිය වසර 5 තුළ ඉටුකළ ඉදිකිරීම් වැඩවල වාර්ෂික සාමාන්‍යය පරිමාව ශ්‍රීලං.රු. මිලියන 1800 ක් හෝ ඇ.ඩොලර් මිලියන 9.7 ක් විය යුතුය. ලංසුකරුවන් පසුගිය වසර පහක (2018/2019, 2017/2018, 2016/2017, 2015/2016, 2014/2015) විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුවේ.

   ඇ) ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම්වල අවම වටිනාකම් අනෙකුත් කොන්ත්‍රාත්තුමය බැඳීම් සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවිය හැකි යම් අත්තිකාරම් ගෙවීම් හැර ශ්‍රී ලං.රු. මිලියන 300 කට හෝ ඇ.ඩොලර් මිලියන 1.6 කට නොඅඩු විය යුතුය.

5. අභිලාෂී ලංසුකරුවන්ට, ශ්‍රී ලංකාව, කුලියාපිටිය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ, වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙතින් වැඩිමනත් තොරතුරු ලබාගත හැකි අතර, 2020 දෙසැම්බර් 24 දින සිට 2021 ජනවාරි 22 දින දක්වා ඕනෑම කාර්යාල දිනයකදී පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර එම ලිපිනයේදීම ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථන අංක : 037-4548205 (කාර්යාලය), 037-4548208 (කාර්යාලීය) 076-116517 (ජංගම), ෆැක්ස් : +94 37 4550599 විද්‍යුත් තැපෑල : projectdirectorwutdp@gmail.com

6. ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ශ්‍රී ලං. රු. හැත්තෑපන්දහසක (රු. 75,000/-) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2020 දෙසැම්බර් 24 දින සිට 2021 ජනවාරි 22 දින තෙක් ඕනෑම කාර්යාල දිනයක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

7. ශ්‍රී ලංකාව, කොළඹ 07 වෝඩ් පෙදෙසේ නො. 18, අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයේ), අධ්‍යක්ෂ (යටිතල සහ සංවර්ධන) කාර්යාලයට යොමු කළ ලංසු, ශ්‍රී ලංකාව කොළඹ 07, වෝඩ් පෙදෙසේ, නො. 18, අධ්‍යාපන අමාත්‍යාංශයේ, (උසස් අධ්‍යාපන අංශයේ) අධ්‍යක්ෂ (යටිතල හා සංවර්ධන) කාර්යාලය වෙත 2021 පෙබරවාරි 11 දින පෙ.ව. 11.00 හෝ ඊට පෙර ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම, එම අවස්ථාවට සහභාගිවීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ.

8. ලංසු, ලංසු භාරගැනීමේ අවසාන දිනයේ සිට දින 189 ක කාලයකට වලංගු විය යුතුය. ලංසු 2021 අගෝස්තු 19 දින දක්වා වලංගු විය යුතුය.

9. සෑම ලංසුවක් සමගම පහත සඳහන් ආකාරයට ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුවේ.

   අ) ස්ථාවර ලංසු පෝරමයේ 11 වන වගන්තියෙහි සඳහන් ආකාරයෙන්.

   ආ) ශ්‍රී ලංකාව, කුලියාපිටිය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය (මාකඳුර පරිශ්‍රය) නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ නමින්.

   ඇ) ලංසු මිලෙන් 2% ක මුදලක් ශ්‍රී ලංකා රුපියල් වලින් වැට් හැර

   ඈ) ලංසු වංලගුවෙන් ඔබ්බට දින 28 ක කාලයකට වලංගු

   ඉ) 2021 සැප්තැම්බර් 16 දින දක්වා වලංගු

   ඊ) ලංසු දත්තයන්හි අංක 02 වගන්තියෙහි දක්වා ඇති නියෝජිතායතන වලින් එකකින් නිකුත් කළ.

10. පූර්ව - ලංසු රැස්වීමක්, 2021 ජනවාරි 12 දින පෙ.ව. 9.30 ට කුලියාපිටිය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ, පරිපාලන ගොඩනැගිල්ලේ දී පැවැත්වේ.

11. සියලුම ලංසුකරුවන්, ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශයේ අංක 03/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා සමග සංසක්ත විය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය (මාකඳුර පරිශ්‍රය),**
**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය,**
**කුලියාපිටිය, ශ්‍රී ලංකාව.**
**2020 දෙසැම්බර් 24**

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ (කුලියාපිටිය පරිශ්‍රය) යෝජිත නගර සංවර්ධන ව්‍යාපෘති (ඉදිකිරීම්)

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

**IFB අංක : 2019/WU/TP/NCB/05**

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සෞදි අරාබි රාජධානියේ රියාද්හි සංවර්ධනය සඳහා වන සෞදි අරමුදලින්, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ (කුලියාපිටිය පරිශ්‍රය) යෝජිත නගර සංවර්ධන ව්‍යාපෘතිවල පිරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය මුදලේ ලැබීම්වලින් කොටසක්, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ (කුලියාපිටිය පරිශ්‍රය) යෝජිත නගර සංවර්ධන ව්‍යාපෘති සඳහා වන කොන්ත්‍රාත්තුව IFB අංක 2019/WU/TP/NCB/05 යටතේ වන ගෙවීම් සඳහා යොදා ගැනීමට අදහස් කෙරේ.

2. ශ්‍රී ලංකාව, කුලියාපිටිය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙනුවෙන්, අමාත්‍ය මණ්ඩලය මගින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ (කුලියාපිටිය පරිශ්‍රය) පහත විස්තර කොට ඇති පරිදි හා ශ්‍රී ලං.රු. මිලියන 1,830 ක් වැය වෙතැයි ඇස්තමේන්තු කළ යෝජිත නගර සංවර්ධන ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් දැන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

3. මෙම කර්මාන්තයට, විවිධ පොදු පහසුකම් සමගින් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයට සහ ආසන්න සමාජයට විවිධ පොදු පහසුකම් සලසා දීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලයේ කුලියාපිටිය පරිශ්‍රය සඳහා "නගර සංවර්ධන ව්‍යාපෘතිය" ක් ඉදිකොට නිමා කිරීම ඇතුළත්ය. මෙය, පහසුකම් මධ්‍යස්ථානය, පුස්තකාලය, ව්‍යාපාරික මධ්‍යස්ථානය, නිල නිවාස, සංචාරක බංගලාව, මාර්ග දෙපස සංවර්ධනය, විශ්වවිද්‍යාල ප්‍රවේශ සංවර්ධනය, ආදි මෙතුළ සංස්ථාගත කොට ඇති පරිදි ඉදිකිරීම් වලින් සමන්විත වේ.

4. චිත්‍ර සටහන්, පිරිවිතරයන් සහ ප්‍රමාණ සහතිකයන්හි හඳුනාගනු ලැබූ, බිම් වැඩ, කොන්ක්‍රීට් වැඩ, පෙදරේරු වැඩ, ව්‍යුහමය / කාකැසින්ග් ලෝහ / දැව ආවරණ / වැසීම් ජලරෝධක, ලයිනින් / තහඩු වැසීම් / කොටස් වෙන් කිරීම්, දොර / ජනේල / පඩිපෙළ, මතුපිට නිමාකිරීම්, ගෘහ භාණ්ඩ / උපකරණ, බාහිර සුළු ගැළපීම් ගොඩනැගීම, ගල් ඇල්ලීම් / පැළ සිටුවීම් / වැට ගැසීම් / වැඩ බිම් ගෘහ භාණ්ඩ, ඉවත්කිරීමේ පද්ධති, නළ ජල සැපයුම් පද්ධති, යාන්ත්‍රික තාපකරණ / සිසිල්කරණ / ශීතකරණ පද්ධති, වාතාශ්‍ර / වායුසමීකරණ පද්ධති, විදුලි සැපයුම් / ආලෝකකරණ පද්ධති, සන්නිවේදන / ආරක්ෂක / පාලක පද්ධති, ප්‍රවාහන පද්ධති යනාදියෙන් සමන්විත, මෙම සංවර්ධනය යටතේ වන ප්‍රධාන ගොඩනැගිලිවල දළ බිම් ප්‍රදේශයේ එකතුව ආසන්න වශයෙන් වර්ග මීටර් 14,500 ක් වේ.

5. වැඩ නිමාකිරීමේ කාලය දින 548 කි.

6. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු හෝ හවුල් ව්‍යාපාර කොටස්කරුවන් අසාධු ලේඛන ගත වූවන් නොවිය යුතුය.

   **ලංසු ඉදිරිපත් කිරීමට යෝග්‍යතා :**

   **ශ්‍රී ලාංකික කොන්ත්‍රාත්කරුවන් :**

   ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ CS1 හෝ ඉහළ ශ්‍රේණියක ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

   **සෞදි අරාබිය කොන්ත්‍රාත්කරුවන් :**

   සෞදි අරාබි රාජධානියේ ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ ව්‍යාපාර ලියාපදිංචියක් ලබා තිබිය යුතු අතර, ශ්‍රී ලංකාවේ, CIDA සමග ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා CS1 ශ්‍රේණියේ ලියාපදිංචිය ලබා ඇති ශ්‍රී ලාංකික කොන්ත්‍රාත්කරුවකු හා සමග හවුල් ව්‍යාපාරයක යෙදී සිටිය යුතුය.

   CIDA ලියාපදිංචිය ලංසු භාරගැනීමේ අවසාන දිනය තෙක් වලංගු විය යුතු අතර, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන දිනයේදී ද වලංගු විය යුතුය.

7. කොන්ත්‍රාත්තුවේ වර්ගය නිමා කළ ප්‍රමාණය අනුව ගෙවීම් වර්ගය වේ.

8. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට පහත සඳහන් අවශ්‍යතාද ඇතුළත් වේ.

| වාර්ෂික ඉදිකිරීම් පිරිවැයෙහි සාමාන්‍ය (පසුගිය වසර 5) | ද්‍රවශීල වත්කම් / ණය මාර්ගය ශ්‍රී ලංරු. | සමාන ස්වභාවයේ විශේෂිත ඉදිකිරීම් පිළිබඳ පළපුරුද්ද (අවම මහල් 4 ක RCC) |
|---|---|---|
| මිලියන 1,830 | මිලියන 305 | 2015 ජනවාරි 1 වන දින හා ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය අතර ශ්‍රී ලංකා රු. මිලියන 1,600 කට වඩා නොඅඩු විටිනාකමැති කොන්ත්‍රාත් අඩුතරමින් 01 ක් හෝ සම්පූර්ණ කර තිබිය යුතුය. |

9. අභිලාෂී ලංසුකරුවන්ට, ශ්‍රී ලංකාව, කුලියාපිටිය, ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ, වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන වයාපෘතියේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙතින් වැඩිමනත් තොරතුරු ලාබගත හැකි අතර, 2020 දෙසැම්බර් 24 දින සිට 2021 ජනවාරි 22 දින දක්වා ඕනෑම කාර්යාල දිනයකදී පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර එම ලිපිනයේ දීම ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

   විමසීම් : +94 37 4548208 (කාර්යාලය), +94 71 2801063

   විද්‍යුත් තැපෑල : projectdirectorwutdp@gmail.com

10. ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ශ්‍රී ලං. රුපියල් ලක්ෂයක (රු. 100,000/-) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2020 දෙසැම්බර් 24 දින සිට 2021 ජනවාරි 22 දින තෙක් ඕනෑම කාර්යාල දිනයක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

11. අනුපිටපතකින් යුත් ලංසු 2021 පෙබරවාරි 11 දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර, ශ්‍රී ලංකාව, කොළඹ 07, වෝඩ් පෙදෙසේ, නො. 18, අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයේ) අධ්‍යක්ෂ (යටිතල සහ සංවර්ධන) වෙත ගෙනැවිත් භාරදිය යුතුය.

    ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාර ගැනීමේ අවසාන වේලාව ඉකුත් වූ වහාම, එම අවස්ථාවට සහභාගි වීමට බලාපොරොත්තුවන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කෙරේ.

12. ලංසුකරණ දත්තයන්හි පැහැදිලිව දක්වා ඇති දිනය තෙක් ලංසු වලංගු විය යුතුය.

13. ලංසුකරණ දත්තයන්හි නියම කොට ඇති විස්තර පරිදි සියලුම ලංසු සමග ලංසු මුදලින් 2% කට සමාන ලංසු සුරක්ෂණයක් ශ්‍රී ලංකා රුපියල් වලින් (වැට් හැර) ඉදිරිපත් කළ යුතුය.

14. පූර්ව - ලංසු රැස්වීමක්, ශ්‍රී ලංකාව, කුලියාපිටිය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේදී (ස්ථානය) 2021 ජනවාරි 13 දින (දිනය) පෙ.ව. 9.30 ට (වේලාව) පැවැත්වේ.

15. සියලුම ලංසුකරුවන් ශ්‍රී ලංකා / මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 පිළිපැදිය යුතු වේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**වයඹ විශ්වවිද්‍යාලයීය නගර සංවර්ධන ව්‍යාපෘතිය,**
**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය,**
**කුලියාපිටිය,**
**ශ්‍රී ලංකාව.**

**2020-12-24**